රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 03/2012
මගේ අංකය : PSC/EST/1/7/1/2011

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
177, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

2012.12.24

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව අක්‍රියව පැවති කාලය තුළ අමාත්‍ය මණ්ඩලය විසින් දෙනු ලැබූ විනය නියෝගවලට එරෙහිව ඉදිරිපත් කරන ලද අභියාචනා</u>

2009.04.09 සිට 2011.05.12 දින දක්වා රාජ්‍ය සේවා කොමිෂන් සභාව අක්‍රියව පැවැති කාල පරිච්ඡේදය තුළ, එකී කොමිෂන් සභාව එසේ අක්‍රියව නොපැවතියේ නම්, එම කොමිෂන් සභාවේ විෂය පථය යටතට පත්විය හැකිව තිබූ විනය කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ මගින් අතෘප්තියට පත්-රාජ්‍ය නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා 2012.10.30 දිනැති අංක 12/1534/558/041 – 1 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් 2012.11.14 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය අනුව, පහත සඳහන් සීමිත හේතූන් මත සලකා බැලීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

I. විධිමත් විනය පරීක්ෂණයේදී හෝ, අමාත්‍ය මණ්ඩලය විසින් තීරණ ගැනීමේ අවස්ථාවේදී හෝ අවධානය යොමුවිය යුතුව තිබූ, එහෙත් එසේ අවධානය යොමු නොවූ කිසියම් කරුණක් හෝ කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් ඉදිරිපත් කරන අභියාචනා.
II. විධිමත් විනය පරීක්ෂණය ආරම්භයේ පටන් අදාළ විනය නියෝගය නිකුත් කිරීම දක්වා වූ ක්‍රියා පරිපාටියේදී චූදිත නිලධාරියාට යම් අගතියක් වන අන්දමේ ක්‍රියා පරිපාටික දෝෂයන් සිදුව ඇති බව පෙන්වා දෙමින් ඉදිරිපත් කෙරෙන අභියාචනා.
III. අදාළ විනය බලධරයාගේ කර්තව්‍යයන් ක්‍රියාත්මක කරමින් අමාත්‍ය මණ්ඩලය විසින් දෙන ලද යම් විනය නියෝගයක්, ඒ හා සමාන වරදක් සඳහා අතීතයේදී දී ඇති විනය නියෝගයක් / දඬුවමක් අභිබවා ගොස් ඇතැයි සඳහන් කරමින් ඉදිරිපත් කෙරෙන අභියාචනා.

02. ඉහත සඳහන් හේතූන් යටතේ ගැනෙන අදාළ අභියාචනා 2013.02.28 දින දක්වා බාර ගැනීමටත්, 2013 පෙබරවාරි මස 28 වන දිනෙන් පසුව එකී අභියාචනා කිසිවක් බාර නොගැනීමටත් කොමිෂන් සභාව තීරණය කර ඇත.

03. මෙම අභියාචනා අදාළ අමාත්‍යාංශ ලේකම්/ පළාත් සභා ප්‍රධාන ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් එවිය යුතු අතර, එකී අභියාචනයේ ප්‍රගමන පිටපතක් 2013 පෙබරවාරි මස 28 වන දිනට මෙම කාර්යාලය වෙත ලැබෙන පරිදි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී.එම්.එල්.සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත් : 1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. ගරු නීතිපති.